# ශ්‍රී ලංකාවේ රණවිරුවන්ගේ දෙමව්පියන්ට අතදීමට
# විරු මාපිය සරණ

**ඕස්ට්‍රේලියාවේ කාරුණික ශ්‍රී ලාංකිකයන්ගේ දායකත්වයෙන් මේ වන විට රණ විරු දරුවන් වෙත ඩොලර් එක් ලක්ෂ හතලිස් දෙදහසක් ලබා දී ඇති විරු දරු දිරිය අරමුදල මගින් දිවි පිදූ රණ විරුවන්ගේ දෙමව්පියන්ට ආධාර කිරීම සඳහා විරු මාපිය සරණ ව්‍යාපෘතිය ආරම්භ කර ඇත.**

**රටවෙනුවෙන් දිවි පිදූ විවාහක රණවිරුවන්ගේ භාර්යාවන්ට සහ දරුවන්ට රජයෙන් දීමනා ලැබෙන නමුත් ඔවුන් හැදූ වැඩූ දෙමව්පියන් බොහෝ දෙනෙක් නොයෙක් අමාරුකම් මධ්‍යයේ ජීවත් වන බව ප්‍රකට කරුණකි.**

**පසුගිය කාලයේදී රජය විසින් රජයේ දීමනා වලින් 10% ක් එවැනි දෙමව්පියන්ට ලබා දීමට කටයුතු කර ඇති නමුත් බොහෝ අවස්ථාවලදී එම දෙමව්පියන් එසේ ලැබෙන දීමනාවන්ද තම දරුවන්ගේ පවුල්වලටම ආපසු ලබාදෙන බව දැනගන්නට ලැබී ඇත.ඔවුන් එසේ කරන්නේ තමන්ට කුමන අගහිඟකම් තිබුනත් තම මුණුබුරු මිණිබිරියන්ට අඩු පාඩු නොවීමට වග බලා ගැනීමේ උදාර චේතනාවෙනි.**

**මෙම උදාර සත්ක්‍රියාවට දායක වීමට පහත සඳහන් කමිටු සාමාජිකයන්ගෙන් විස්තර ලබා ගත හැක.**

චන්ද්‍රා අතාවුදගේ - (03) 9795 5070 ,
කේ රන්දෙණිය - (03) 9713 1124 ,
නිමල් රාජකරුණා - (03) 9800 3965

e-mail – nimal21@bigpond.com